ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
University of Sri Jayewardenepura
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit

මගේ අංකය / My Number: USJP/ EEX - 15
ඔබේ අංකය / Your Number:
දුරකථනය / Telephone: 011-2801481, 011-3132496, 011-2803550
ෆැක්ස් / Fax: 011-2802753
වෙබ් අඩවිය / Website: www.external.sjp.ac.lk
විද්‍යුත් තැපැල / E-mail: info.ext@sjp.ac.lk

2025-10-15

ගරු ස්වාමීන් වහන්ස/ මහත්මයාණනි/ මහත්මියනි/ මෙනෙවියෙනි

**2020 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව**

**ශිෂ්‍ය ලියාපදිංචිය දීර්ඝ කිරීම**

2020 අධ්‍යයන වර්ෂයට ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ ඔබගේ එම ලියාපදිංචි කාල සීමාවට අදාළ සියලුම පරීක්ෂණ දැනට පවත්වා අවසන් කර ඇත. ඒ අනුව 2021-08-01 සිට 2024-07-31 දක්වා වූ ප්‍රථම ලියාපදිංචි කාල සීමාව තුල ඔබට උපාධිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී තිබේ නම් හා තවදුරටත් පුනර් අපේක්ෂකයෙකු ලෙස අධ්‍යයන කටයුතු කරගෙන යාමට අවශ්‍ය වන්නේ නම් එම ලියාපදිංචිය දීර්ඝ කර ගත යුතුය.

උපාධිය සම්පූර්ණ කිරීමට අදාල නිර්ණායක 2020 අධ්‍යයන වර්ෂයට අදාල මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා බාහිර උපාධි විවරණිකාවෙහි දැක්වෙන අතර එය පරිශීලනය කිරීමෙන් තොරතුරු ලබා ගත හැකිය.

එසේම පරීක්ෂණ සඳහා අයදුම් කිරීමට පෙර ලියාපදිංචිය දීර්ඝ කර තිබීම අනිවාර්ය වේ. ඒ සඳහා නියමිත මුදල් ගෙවිය යුතු ගිණුම් අංකය Student Profile වෙත පිවිසි Student හි Payments මඟින් ලබාගත හැකිය. ඔබට අදාළ ගිණුම් අංකවලට දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට මුදලින් ගෙවීම හෝ VISA හෝ Master (debit/credit) කාඩ්පත් මඟින් ගෙවීම් කල හැකිය. ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා එක් එක් අයදුම්කරුවන් වෙනුවෙන් වෙන වෙනම ගිණුම් අංක ලබා දී ඇති බැවින් ඔබට අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කල යුතුය. **(ගෙවීම් රිසිට්පත සහ ශිෂ්‍ය වාර්තා පොත තැපැල් මඟින් එවීම අවශ්‍ය නොවන බව වැඩිදුරටත් දන්වමි.)**

- **ලියාපදිංචිය දීර්ඝ කිරීමේ ගාස්තු - එක් වසරක් සඳහා රු. 5000.00**

පවත්නා නිර්ණායක අනුව පහත පරිදි ඔබගේ ලියාපදිංචිය දීර්ඝ කල හැක.

| ලියාපදිංචිය | ලියාපදිංචි වලංගු දිනය | ලියාපදිංචි ගාස්තුව |
|---|---|---|
| ❖ ලියාපදිංචිය දීර්ඝ කිරීම - I | 2024-08-01 – 2025-07-31 | රු. 5000.00 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම - II | 2025-08-01 – 2026-07-31 | රු. 5000.00 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම - III | 2026-08-01 – 2027-07-31 | රු. 5000.00 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම - IV | 2027-08-01 – 2028-07-31 | රු. 5000.00 |

❖ **ඔබ විසින් 2023 ශාස්ත්‍රවේදී (සමාන්‍ය) බාහිර උපාධි I පුනර් පරීක්ෂණයට පෙනී සිටීමට අපේක්ෂා කරන්නේ නම් පළමු ලියාපදිංචිය දීර්ඝ කිරීම කල යුතුය.**

<u>සැලකිය යුතුයි</u>

- *ඉදිරියට පවත්වන පුනර් පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවීමේදී* ***පල කරන විස්තර පත්‍රිකාවේ එම පරීක්ෂණය සඳහා ඔබගේ කණ්ඩායමට අදාළව තිබිය යුතු ලියාපදිංචි වලංගු දිනය*** *දැක්වෙන අතර රු. 5000.00 මුදල ගෙවා ලියාපදිංචිය දීර්ඝ කරගත යුතුය.*

- *පාඨමාලා වාරික ගෙවීමේ අයදුම්පත්, සම්මන්ත්‍රණ කාලසටහන්, පරීක්ෂණ කාලසටහන්, විභාග ප්‍රවේශ පත්‍ර සහ සියලුම විස්තර* Student Profile *ඔස්සේ ලබා ගත හැකිය.* Student Profile වෙත පිවිස Active කර ගැනීම ඔබ සතු වගකීමක් වේ. ***දිනපතා වෙබ් අඩවිය හා Student Profile පරිශීලනය කිරීම අනිවාර්ය වේ. තැපැල් මඟින් ලිපි එවනු නොලැබේ.***



ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

2025-10-15